# 2025 ජුනි මාසයට අදාලව 2025.06.24 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.06.24
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 07. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 08. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 09. ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනි සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 14. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 15. ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 16. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හෙබ වීය. 2025.06.06 දින පවත්වන ලද මංගල මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.06.17 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

එහිදී නැගී සිටි එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් , වාර්තාවේ 2 වැනි පිටුවේ දෙවන පරිච්ඡේදය සංශෝධනය වියයුතු බව පවසා සිටි අතර මංගල මහ සභාවට සහභාගි වීමට ලබාදුන් **"සංදේශය"** යන්න **"ලිපිය"** ලෙස නිවැරදි වියයුතු බවත් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුව අසුන් පැනවීමේදී ජ්‍යෝෂ්ඨතාවය අනුව අසුන් පැනවිය යුතු වුවත් ආණ්ඩු පක්ෂය හා විපක්ෂයේ මන්ත්‍රීවරුන් එක ළඟ සිටීම ප්‍රායෝගිකව ගැටලු සාකච්ඡා කිරීමට පහසු වන බැවින් සභාපතිතුමා විසින් අසුන් පනවා ඇති ආකාරය නිවැරදි යි ලෙස පැවසූ බව , ලෙස සංශෝධනය වියයුතු බව පෙන්වා දෙන ලදී.

එම්.එම්. තිස්ස ගුණසිංහ මනත්‍රීවරයාගේ මන්ත්‍රී ධූරය මීට පෙර පැවති සභා වාරය අවසන් වීමට පෙර අහෝසි වී නැවත 2025 පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත්වීම හේතුවෙන් අඛන්ඩව මෙම ගරු සභාව නියෝජනය නොකල මන්ත්‍රීවරයකු බැවින් එතුමාගේ ජේෂ්ඨතාවය බිඳවැටී ඇති බවත් වත්මන් ප්‍රාදේශීය සභාවේ ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරයෙකු නොමැති බැවින් 2025 මැයි 31 ගැසට් පත්‍ර ප්‍රකාරව අසුන් පනවා ඇති ආකාරය නිවැරදි බව ගරු සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදී.

ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා සංශෝධන සහිතව මංගල මහසභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු 2025.06.06 දිනැති මංගල සභා වාර්තාව සභා සම්මත විය.

## 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

### 02.01. 2026 වර්ෂය සඳහා අයවැය ලේඛන පිළියෙල කිරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168(1) වගන්තිය ප්‍රකාරව නියම කර ඇති පටිපාටිය අනුව 2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට අදාලව අයවැය ලේඛනයක් පිළියෙල කිරීම සිදුකළ යුතුව ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රී තුමියන්ලාගේ සංවර්ධන යෝජනා කාර්යාලය වෙත 2025 ජුනි 30ට පෙර ලබා දෙන ලෙස දැනුවත් කරන ලදී.

### 02.02. අභිනවයෙන් තේරීපත්වූ මන්ත්‍රී මණ්ඩලයේ සියළුදෙනාගේ වත්කම් හා බැරකම් ලේඛන භාරදීම.

2025.06.30 දිනට පෙර අභිනව මන්ත්‍රී මණ්ඩලයේ වත්කම් හා බැරකම් ප්‍රකාශ පළාත් පාලන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත යැවිය යුතු බැවින් මේ වන තෙක් වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර නොදුන් මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සභා ලේකම් වෙත භාර දෙන ලෙස නිවේදනය කරන ලදී.

### 02.03.ගිලා බැස ඇති මීගහඅරාව පාලම ප්‍රතිසංස්කරණය කිරීම.

2025.06.22 දින මන්ත්‍රී මණ්ඩලය හා මහජනතාව ශ්‍රම දායකත්වයෙන් බිබිල නගරය හා නගරයේ සිට මීටර් 200ක් පමණ දුරට මාර්ග සුද්ධ කර කුණු කසළ ඉවත් කළ බවත් ඒ සඳහා සහභාගී වූ සියළු දෙනාට ස්තූතිය පල කළ අතර 2025.06. 22 වැනි දින රාත්‍රියේ ලොරි රථයක් ගමන් කිරීමේදී මීගහඅරාව පාලම ගිලා බැස ඇති බැවින් එම පාලම නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කළ බවත් ඒ සඳහා දායකත්වය ලබාදීමට තීරණය කළ බවත් ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දන්වන ලදී.

2025 ජුනි මස 24 දින පවත්වනු ලබන මහ සභාව සඳහා විපක්ෂ මන්ත්‍රීවරුන්ට යෝජනා ලබාදීමට දැනුවත් නොකල බැවින් විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩකර ඇති බවත් මංගල මහ සභාව පැවැත්වූ දින සිට ජුනි 24 දින දක්වා කාලය යෝජනා ලබාදීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බවත් පවසා සිටි ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා , සියළු මන්ත්‍රීවරුන් සඳහා සමාන වරප්‍රසාද පවතින බැවින් සමාන වරප්‍රසාද ලබා දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

2025 ජුනි 06 දින පවත්වන ලද මංගල මහ සභාවේදී 2025 ජුනි 24 වන දින නැවත මාසික මහ සභාවක් පවත්වන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටි බවත් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කිරීමට මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගේ වගකීම බවත් පනත ප්‍රකාරව කටයුතු කර ඇති බවත් ගරු සභාපති තුමා විසින් දන්වා සිටින ලදී. ජාතික ජන බල වේගයේ මන්ත්‍රීවරුන් මැතිවරණ සමයේ දී හඳුනා ගන්නා ලද යෝජනා ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටි බැවින් එම මන්ත්‍රීවරුන් මෙම මහ සභාව සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බවත් එම මන්ත්‍රීවරුන් සඳහා වෙන වෙනම දැනුවත් නොකළ බවත් පක්ෂ විපක්ෂ වශයෙන් මනිත්‍රීවරුන් සඳහා කිසිදු  වෙනසක් නොමැති බවත් සියළුදෙනා හට යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබෙන බවත් සභා අරමුදලේ මුදල් ශේෂය සැලකිල්ලට ගනිමින් එම යෝජනා ක්‍රියාත්මක කරමු යැයි පවසා සිටි අතර යම් ප්‍රමාද දෝෂයක් සිදුවූවා නම් කණගාටුව ප්‍රකාශ කරන බවද ගරු සභාපතිතුමා  දන්වා සිටියේය.

2025 ජුනි මස 22 වන දා පැවැත්වූ ශ්‍රමදානය සඳහා තමා හට කිසිදු දැනුම්දීමක් සිදු නොකළ බවත් මෙවන් වූ සත් ක්‍රියාවන් සඳහා තමා සහභාගි නොවීම නිසා ජනතාව අතර තමා ගොඩනගා ගෙන ඇති ප්‍රතිරූපයට හානියක් සිදුවන බව ගරු මන්ත්‍රී ජේ.ඒ. ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් පවසා සිටියේය. එසේම බිබිල ප්‍රාදේශීය සභාව යන නමින් මෙවන් වැඩ සටහන් ක්‍රියාත්මක නොකර ජාතික ජනබල වේගයේ වැඩ සටහනක් ලෙස ජනතාව දැනුවත් කරන්නේ නම් සුදුසු බවත් පවසා සිටි අතර මින් ඉදිරියට වැඩසටහන් පැවැත්වීමේදි විපක්ෂය දැනුවත් නොකරන්නේ නම් **බිබිල ප්‍රාදේශීය සභාව** යන නම අවභාවිතා නොකරන ලෙස  පවසන ලදි.

මෙම උදාර කර්තව්‍ය කෙටි කාලයක් තුළ සංවිධානය කිරීමට සිදුවූ බැවින් සියළු මන්ත්‍රීවරුන් රැස්කර අදහස් එක්කර කටයුතු කිරීමට නොහැකි වූ බවත් තමා මෙම ප්‍රදේශයේ  විධායක නිළධාරි බැවින් බිබිල ප්‍රාදේශීය සභාවේ වැඩසටහනක් පැවැත්වෙන බව දැන්වීම සිදුකළ බවත් මින් ඉදිරියටත් පක්ෂය හෝ විපක්ෂය විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සඳහා ද  බිබිල ප්‍රාදේශීය සභාව යන නම භාවිතා කරන බවයි. එසේම මීට පෙර පැවති පාලනයන්ගෙන් කම්කරු වෘත්තිය සඳහා සේවකයන් බඳවා ගත්තද ඒ අයගෙන් සමහර කම්කරුවන්ගෙන් කිසිම සේවයක් සිදු නොවන බැවින් ඒ සියළු දෙනාගෙන් එක හා සමානව  සේවයක් ලබා ගැනීම සඳහාත්  වැඩ කරන හා වැඩ නොකරන කම්කරුවන් කවුරුන්දැයි හඳුනා ගැනීම සඳහාත් වැඩ වේගවත්ව සිදුකිරීමේ ක්‍රමයක් ලෙසත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ බවත් මෙම  ශ්‍රමදානය සඳහා ජාතික ජන බලවේගයේ මන්ත්‍රීන් මෙන්ම මහ ජනතාව විශාල ප්‍රමාණයක් සහභාගිවූ බවත් පී.කේ.ඩී.පුෂ්පකුමාර මැතිතුමාට ද  මේ සම්බන්ධයෙන් දැන්වූ බවත් එතුමාගේ විවිධ කාර්යන් නිසා සහභාගිවීමට අවස්ථාවක් නොලැබී ඇති බවත් සහභාගිවූ සියළු දෙනා හට ස්තූතියද ගරු සභාපතිතුමා විසින් පුද කර සිටියේය.

මෙම ශ්‍රමදානය සඳහා  බිබිල ප්‍රාදේශීය සභාව  යන නාමය භාවිතා කර ජාතික ජනබලවේගයේ  යටි අරමුණු ඉටු කර ගත් බවත් එම නිසා මෙම නම  අවභාවිතා නොකර  ජාතික ජනබලවේගයේ ශ්‍රමදානයක් ලෙස ප්‍රසිද්ධ කරා නම් සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා පවසා සිටියේය.

මීට පෙර පැවති පාලන සමයන් වලදී විරුද්ධ පක්ෂයන් මෙවැනි වැඩසටහන් සඳහා සහභාගි කර ගත්තා දැයි ගරු මන්ත්‍රී  ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා  විසින් ප්‍රශ්න කළ අතර ගරු සභාපති තුමා විසින් පෙර පැවති පාලනයන් පිළිබඳ නැවත ආවර්ජනය නොකර කටයුතු කරමු යැයි දන්වා සිටියේය. ගරු මන්ත්‍රී ජේ.ඒ.ගාමිණී විජේන්ද්‍රනාත් මැතිතුමා පවසා සිටියේ පෙර පැවති පාලනයන් වෙනස් කර System

Chenge කිරීම සඳහා මෙම වර්තමාන පාලනය සඳහා හාරදී ඇති බවත් පෙර ආකාරයෙන්ම වර්තමාන කටයුතු සිදුවන්නේ නම් System Chenge වීමක් සිදුවී නොමැති බවයි. මෙම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආකල්ප වෙනස්වී නොමැති බවත් සභාව නොමග නොයවා ඉදිරියට පවත්වාගෙන යාම සුදුසු බවත් ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා පවසා සිටියේය.

## 03.<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබිම.</u>

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 04.<u>යථාපරිදි කල්දි ඇති ප්‍රශ්න.</u>

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දි ඇති යෝජනා.

## 05.01.<u>ගරු මූලාසනයේ යෝජනා.</u>

## <u>05.01.01. බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අබලන් වී ඇති සියළු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.</u>

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අබලන් වී ඇති මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මහජනතාවගේ ඉල්ලීම් ලිපි නිරන්තරයෙන් ලැබේ. එබැවින් අබලන් වී ඇති සියළුම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එම අවස්ථාවේ නැගී සිටි ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා පවසා සිටියේ සෑම පාලන සමයකම සෑම වර්ෂයක් පාසාම මාර්ග නියං කාලයේදී මෝටර් ග්‍රේඩර් කර ප්‍රතිසංස්කරණය කරන බවත් ඒවා නැවත වර්ෂා කාලයේදී මඩවීම මෙන්ම නිවෙස්වල පිවිසුම් මාර්ග සාදාගැනීමට කාණු පිරවීම නිසා කාණුවලින් ජලය නිසි ලෙස බැස නොයෑම නිසා හා වාහන නිතර ගමන් කිරීම නිසා මාර්ග මඩ වීමට ලක්වී තිබූ තත්වයට පත්වන බැවින් ප්‍රමුඛතාවය පදනම් කරගෙන කොට්ඨාස මට්ටමින් එක් මාර්ගයක්වත් නිසි පරිදි කාණු පද්ධති සකස් කොට නිවෙස් වලට පිවිසුම් මාර්ගද ඉදිකරදී බෝක්කු සකස් කර එම මාර්ගය කොන්ක්‍රීට් කර සකස් කරන්නේ නම් ඉතා හොඳ බව පෙන්වා දෙන ලදි.

එහිදි ගරු සභාපතිතුමා පවසා සිටියේ කොට්ඨාස මට්ටමින් ප්‍රමුඛතාවය පදනම් කරගෙන මාර්ග තෝරා ගැනීමට යාමේදී ඊට ජනතා විරෝධය එල්ල වන බවත් කොට්ඨාස මට්ටමින් සභාවේ වාහන එහා මෙහා ගෙන යාමේදී වැඩි ඉන්ධන පිරිවැයක් දැරිමට සිදුවන බැවින් එක් කොට්ඨාසයක ඇති සියළුම මාර්ග මොටර් ග්‍රේඩර් කර සකස් කිරීම සුදුසු බවයි. මෙය නිල්ගල කොට්ඨාසයෙන් ආරම්භ කර එම කොට්ඨාසයේ මාර්ග සියල්ල කපා අවසන් කර ඊළඟ කොට්ඨාසයේ මාර්ග ඉදිකිරීම ආරම්භ කළයුතු බවයි.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අබලන් වී ඇති මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොට්ඨාස මට්ටමින් ප්‍රමුඛතාවය පදනම් කරගෙන මාර්ග තෝරා ගැනීමට යාමේදී ඊට ජනතා විරෝධය එල්ල වන බවත් කොට්ඨාස මට්ටමින් සභාවේ වාහන එහා මෙහා ගෙන යාමේදී වැඩි ඉන්ධන පිරිවැයක් දැරීමට සිදුවන බැවින් නිල්ගල කොට්ඨාසයෙන් ආරම්භ කර එම කොට්ඨාසයක ඇති අබලන් සියළුම මාර්ග මෝටර් ග්‍රේඩර් කර ප්‍රතිසංස්කරණය කර ඊළඟ කොට්ඨාසයේ මාර්ග ප්‍රතිසංස්කරණය ආරම්භ කරමින් වසම් 40හේම අබලන් වී ඇති මාර්ග සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.02.රතුපස්කැටිය ජල ගබඩා ටැංකියේ සිට ඉසුරු උයන දක්වා ජල නල පද්ධතියක් ඇතිරීම සම්බන්ධවයි.</u>

ඉසුරු උයන ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ පානීය ජල ගැටළුවට විසඳුමක් ලෙස රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමයේ සිට ඉසුරු උයන දක්වා ජල නල පද්ධතිය ඒකාබද්ධකල යුතුව ඇත. ඒ සඳහා ප්‍රසම්පාදනය කර එය සිදුකරන්නේ නම් රු. මි.11 ක් පමණ වැය වන අතර එම මුදල් සපයා ගැනීම අපහසු බැවින් සභා යන්ත්‍ර සූත්‍ර යොදවා ඍජු ශ්‍රමදායත්වය යටතේ එය සිදු කිරීමට වැය වන මුදලට අදාළව සැකසු රු.4,981,583.00 ක් වු ඇස්තමේනතුවට අනුමැතිය ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.03.බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නව බදු තක්සේරුවෙහි විරෝධතා පරීක්ෂණය පිළිබඳ සංශෝධිත වාර්තාව ඉදිරිපත් කිරීම.</u>

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු සීමාව තුළ පිහිටි දේපල සඳහා 2024 වර්ෂයේ දී නව බදු තක්සේරුවක් සිදු කරන ලදී. එම තක්සේරුවට අදාළ බදු විරෝධතා පරීක්ෂණය 2024 සැප්තැම්බර් මස තක්සේරු නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී. එහි විරෝධතා සංශෝධන වාර්තාව 2025.06.09 දින අප ආයතනය වෙත ලැබුණි. එම වාර්තාව අනුව දේපල විශාල සංඛ්‍යාවක් සංශෝධනයට ලක්වී ඇත. 2024 වර්ෂයේ බිල් කිරීම වන රු.11,904,997. 94 මුදල හා සංශෝධිත දේපලයන්හි වාර්ෂික වටිනාකම ද සංශෝධනයට ලක්වේ.
2024 වර්ෂයට අදාළව වරිපනම් ලේඛන යාවත් කාලීන කර අවසන් කර ඇති බැවින් නැවත එම ලේඛන සංශෝධනය කර ඒ අනුව වරිපනම් ගාස්තු අය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.04. බිබිල නව සතිපොළ ගොඩනැගිල්ලේ F02 සහ F04 කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ F ශ්‍රේණියේ කඩ කාමර 09ක් ඇති අතර ඉන් කඩ කාමර 07ක් මේ වන විට බදු ලබාදී ඇත. F02 සහ F04 කඩකාමර මේ දක්වා බදු ලබාදී නොමැති අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අංක MO/RP/807 හා 2025.05.20 දිනැතිව මෙම කඩ කාමර ටෙන්ඩර් කර බදු ලබාදීම සඳහා ලංසු මුදල හා මාසික කුලී මුදල සම්බන්ධයෙන් තක්සේරු වාර්තාව ලැබී ඇත.

| අනු අංකය | කඩ කාමර අංකය | ආපසු නොගෙවන අත රැදවුම් මුදල (රු.) (Key Money) | ආපසු නොගෙවන අතරැදවුම් මුදලට යටත් මාසික වෙළඳපල කුලිය (රු.) |
|---|---|---|---|
| 01 | F02 | 1,000,000.00 | 1,700.00 |
| 02 | F04 | 1,000,000.00 | 1,700.00 |

ඒ අනුව ටෙන්ඩර් කර බදු ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම අවස්ථාවේදී නැගී සිටි ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා . F02 සහ F04 කඩකාමර සතිපොළ ගොඩනැගිල්ලෙහි කෙලවරක පිහිටා ඇති බැවින් එම කඩ කාමර සඳහා අනෙකුත් F ශ්‍රේණියේ කඩ කාමර වලින් ලබා ගන්නා ආපසු නොගෙවන අත රැදවුම් මුදලම Key money ලබා ගැනීම අසාධාරණ බව පවසා සිටියේය.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී උක්ත යොජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එච්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවක් ක්‍රියාත්මක නොවුණු කාලය තුළ මෙම කඩකාමර අවුරුදු 30කට බදු ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරවර අනුමැතියට ඉදිරිපත් කළද මෙම කාලසීමාව අඩුකර බදු ලබාදීම සඳහා සභා තීරණයක් ගැනීමට සුදුසු බව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් පවසා සිටියේය.

මෙම කඩකාමර බදු ලබාගෙන ඇති බදුකරුවන් සඳහා ලොකු මුදලක් ලබාදී අතුරු බදු ලබාගෙන ඇති බදුකරුවන් සඳහා විශාල මුදලක් වැයවී ඇති බැවින් එම බදුකරුවන්ට ආදායමක් උත්පාදනය කර ගැනීම සඳහා අවුරුදු 30ක් වැනි කාලසීමාවක් ලබාදිය යුතු බව ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා පවසා සිටියේය.

ගරු උප සභාපතිතුමා විසින් වසර 03ක කාලයකට බදු ලබාදීමටත් ආපසු නොගෙවන අතරුදවුම් මුදල ද අඩුකර අය කිරීමට සුදුසු බව පවසා සිටින විට පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මහතා පවසා සිටියේ ව්‍යාපාරික ජනතාවගේ ආදායම් තත්වය පිළිබඳව සලකා බලා කටයුතු කරන ලෙසයි.

කඩකාමර බදු ලබාගනු ලබන්නේ ආයෝජකයින් බවත් ඔවුන් සඳහා කඩකාමර බදු ලබා දීමේදී සභා දේපල සුරක්ෂිත වන ආකාරයෙන් බදු ලබාදීමේ කටයුත්ත සිදු කළයුතු බව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මහතා පවසා සිටියේය.

මෙම කඩකාමර බදුදීම පිළිබඳව න්‍යායාත්මකව කටයුතු නොකර ටික කාලයක් ලබාගෙන විශ්ලේෂණය කර තීරණ ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ජේ.ඒ. ගාමිණි විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා පවසා සිටියේය.

මෙම කඩ කාමර බදු දී ඇති ආකාරය අතුරු බදු දී තිබේද ආදිය පිළිබඳව කරුණු සොයා බලා ගිවිසගෙන ඇති ගිවිසුම් පිළිබඳව නිසි විශ්ලේෂණයක් සිදුකර එම ගිවිසුම් සංශෝධනයට ලක්කිරීම් කළයුතු බවත් එම කඩකාමර බදු දී ඇත්තේ දේශපාලන හිතවත්කම් හා ඥාති හිතවත්කම් හා වෙනත් කිසියම් හෝ පදනමක් මතද යන්න පිළිබඳ සොයා බලා ඒවා හෙළිදරව් කරගෙන කටයුතු කිරීමටත් නගරයේ අනවසර ඉදිකිරීම් තිබෙන බවත් ඒවා ඉවත් කර නිවැරදි කිරීම් කරන්නේ නම් ඒ සඳහා විපක්ෂය ලෙස තමා සහයෝගය ලබා දෙන බව දන්වා සිටි අතර එසේම මෙම කඩ කාමර බදුදීම පිළිබඳව මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව තුළ සාකච්ඡා කර එම තීරණ සභාවට ඉදිරිපත් කර තීන්දු තීරණ ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා ප්‍රකාශ කර සිටියේය.

බිබිල නගරයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා නඩු මගකට ගියහොත් තවත් දිගු කාලයක් එම අනවසර ඉදිකිරීම් කර ඇති ව්‍යාපාරිකයින්ට ව්‍යාපාර කරගෙන යා හැකි බවත් එම නඩු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත් එම ව්‍යාපාරිකයින් සමඟ යම් එකඟතාවයකට ගියහොත් ඒ අය සඳහා තවත් ස්ථානයක් ලබාදීමට පොරොන්දු වීමට සිදුවන බවයි. එම නිසා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම පිළිබඳව තිස්ස ගුණසිංහ මන්ත්‍රීවරයාගේ යෝජනාවට තමා එකඟ බවත් නමුත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අපහසු බවත් දැන්වූ ගරු සභාපතිතුමා මෙම යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර සාකච්ඡා කර නිවැරදි තීරණයක් ගෙන ලබන සභා වාරයට සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමට සුදුසු යැයි සභාපතිතුමා පවසා සිටියේය.

මෙම යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර සාකච්ඡා කර නිවැරදි තීරණයක් ගෙන ලබන සභා වාරයට සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.05.හිඟ කුලී මුදල් නොගෙවන කඩ කාමර නැවත පවරා ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පහත කඩ කාමර සඳහා කුලී මුදල් නොගෙවීම හේතුවෙන් 2025.04.04 දින සිට ගිවිසුම් අවලංගු කරන ලද බවත් කඩ කාමරය සභාවට භාරදෙන ලෙසත් දන්වා බදුකරුවන් ලිඛිතව දැනුවත් කරන ලදි. නමුත් මේ දක්වා කඩ කාමර බිබිල ප්‍රාදේශීය සභාවට භාර දී

නොමැති බැවින් 2025 අප්‍රේල් මස සිට කඩ කාමර සඳහා බිල් කිරීමද නතර කර ඇත.ඒ අනුව ඇතැම් බදුකරුවන් විසින් හිඟ කුලී මුදල් ගෙවීම් කර ඇති අතර නැවත කඩ කාමරය ලබාදෙන ලෙසටත් ලිඛිතව ඉල්ලීම් කර ඇත.

| අනු අංකය | කඩ කාමර අංකය | බදුකරුගේ නම | හිඟ කුලී මුදල රු. | ප්‍රමාද ගාස්තුව රු. |
|---|---|---|---|---|
| 01 | A 02 | එච්.එම්.බෝධිවංශ ගුණසේකර මයා | හිඟ මුදල් ගෙවා ඇත | ප්‍රමාද ගාස්තු ගෙවා ඇත |
| 02 | A 04 | පියදාස කොඩිකාර මයා | 154000.00 | 85000.00 |
| 03 | A 05 | වයි.එම්.සාන්ත කුමාර මයා | හිඟ මුදල් ගෙවා ඇත | ප්‍රමාද ගාස්තු ගෙවා ඇත |
| 04. | B 02 | කේ.පී.අල්විස් මයා | 15200.00 | 3375.00 |
| 05 | B 03 | කේ.එම්.සුමනාවති මිය | 23000.00 | 10125.00 |
| 06 | B 05 | සිරිපාල ගජනායක මයා | 45350.00 | 14025.00 |

ඒ අනුව කුලී මුදල් නොගෙවූ කඩ කාමර නැවත පවරා ගෙන බදුකරුවන් සඳහා නීතිමය පියවර ගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

මෙම බදුකරුවන් අප්‍රේල් මස සිට මාස තුනක කාලය හිඟ බදු මුදල් නොගෙවා ඇති බැවින් නීතිමය පියවර නොගෙන නිශ්චිත කාලයක් ලබාදී එම කාලය තුළ නොගෙවන්නේ නම් නීතිමය පියවර ගන්නා බවට දැනුම් දීමක් කර එසේ නොවන්නේ නම් නීතිමය පියවර ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටියේය.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සාකච්ඡාවට අනුව මෙම කඩ හිමියන් හිතාමතා ගෙවීම් මගහැර ඇති බවත් ප්‍රාදේශීය සභාවේ සංවර්ධන කටයුතු සඳහා මුදල් අවශ්‍ය බැවින් එම කඩ කාමර පිළිබඳ සුදුසු තීරණයක් ගන්නා ලෙස සභාපතිතුමා විසින් ගරු සභාවට දන්වා සිටින ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා මෙම කඩහිමියන් සඳහා සති දෙකකට පෙර හිඟ කඩකුලී ගෙවීම් නොකළහොත් නීතිමය පියවර ගන්නා බව දන්වා ලිපි යැවීමට කටයුතු කරන ලෙසත් කල්දී ඇති යෝජනා ලෙස ඉදිරි වාරයේදී තීරණයක් ගැනීමට සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව බිබිල ප්‍රාදේශීය සභාවට අයත් A04, B02, B03, B05 කඩ කාමර සඳහා කුලී මුදල් නොගෙවූ බදුකරුවන් සඳහා සති දෙකක් කාලය ලබාදී කුලී මුදල් නොගෙවන්නේ නම් ඒ අය සඳහා නීතිමය පියවර ගන්නා බව දන්වා ලිපි යැවීමට කටයුතු කර කල්දී ඇති යෝජනා ලෙස ඉදිරි වාරයේදී සභාවට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.06. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩ සටහන(ප්‍රාග්ධන) - 2024 (2021 වර්ෂයේ අර්ධ වශයෙන් නිමි ව්‍යාපෘතිවල ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම) සම්බන්ධවයි.</u>

2021 වර්ෂයේ අර්ධ වශයෙන් නිම කර තිබූ බිබිල රථවාහන සේවා මධ්‍යස්ථානයේ උපාංග මිල දී ගැනීම හා සවි කිරීම. (IIඅදියර) ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහා ඉහත වැඩ සටහන යටතේ, පළාත් පාලන අමාත්‍යාංශය හා බිබිල ප්‍රාදේශීය සභාව 50% දායකත්වය ලබා දීමේ එකඟතාව මත බිබිල රථවාහන සේවා මධ්‍යස්ථානයේ උපාංග මිල දී ගැනීම හා සවි කිරීමට කටයුතු කළද පළාත් පාලන අමාත්‍යාංශයෙන් (IIඅදියර) ව්‍යාපෘතිය සඳහා මුදල් නො ලැබීම නිසා HYDRAULIC HOIST, MOBILE GREASE LUBRICATOR උපකරණ සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. ( 2021 වර්ෂයේ අර්ධ නිමි කර්මාන්ත වල ඉතිරි වැඩ කොටස් සභාව සතු පොදු අරමුදල් යොදවා වැඩ අවසන් කර ඇත). අනු අංක 03 හි සඳහන් උපකරණ මිල දී ගැනීම සඳහා රුපියල් 3,092,900.00 ක මුදලක් අවශ්‍ය වී ඇත. එම මුදල සභා අරමුදලින් කාර්ටෙක් ට්‍රේඩිං පුද්ගලික සමාගමට ගෙවීම් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතන | උපකරණය | ඒකකයක මිල | මුළු වියදම |
|---|---|---|---|---|
| 03. | කාර්ටෙක් ට්‍රේඩිං පුද්ගලික සමාගම | AIRTEC 2ATU8 HYDRAULIC HOIST | 1,260,169.49 | 1,487,000.00 |
| | | Vat 18% | 226,830.51 | |
| | | TRANSPORT AND INSTALLATION CHARGES | 1,255,000.00 | 1,480,900.00 |
| | | Vat 18% | 225,900.00 | |
| | | AIRTEC A.T.G.25 MOBILE GREASE LUBRICATOR | 105,932.20 | 125,000.00 |
| | | Vat 18% | 19,067.80 | |
| | | | | 3,092,900.00 |

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.07. 2025 වර්ෂයේ සභා කටයුතු පවත්වාගෙන යාම සඳහා කමිටු පත් කිරීම හා කාරක සභා සඳහා බලතල පැවරීම.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා ,පහත සඳහන් කමිටු සඳහා සාමාජිකයින් පත්කිරිම හා ඊට අදාල කාර්ය කාර්තව්‍ය හා බලගත පැවරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව
02. නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාව
03. කාර්මික සේවා පිළිබඳ කාරක සභාව
04. පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව සඳහා, ගරු සභාපතිතුමා ඇතුළු පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් ධායකයින් සුදුසු බව හා එම කාරක සභාවට පැවරෙන කාර්ය, කර්තව්‍ය හා බලතල ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

<u>මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව</u> සඳහා,

01. ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා - සභාපති
02. ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය
05. ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා
06. ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය
07. ගරු මන්ත්‍රී ඩී.ඒ.නිශාන්ත අමරතුංග මැතිතුමා

හා සම්පත් දායකයින් ලෙස

01. ඒ.එම්.හේමරත්න මහතා - විශ්‍රාමික සභා ලේකම්
02. ඩබ්.ඒ.හර්බට් රත්නවීර මහතා - විශ්‍රාමික ඌව සංවර්ධන බැංකුවේ ක්ෂේත්‍ර නිළධාරි
03. කේ.එච්.එම්.විජේරත්න මහතා - විශ්‍රාමික ඌව සංවර්ධන බංකු කළමණාකරු
04. එම්.ජෝතිපාල මහතා - ප්‍රවීන ඉංග්‍රිසි ගුරු

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

i.ප්‍රාදේශිය සභා පනතේ II වන, III වන, IV වන, V වන සහ VI වන කොටස් සම්බන්ධයෙන් මහා සභාව විසින් අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම.

ii.වරිපනම් සියළුම බදු හා ගාස්තු නියම කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**iii.**අළුත් ආදායම් වර්ග හඳුනා ගැනීම හා ආදායම් පැනවීම පිළබඳව මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**iv.**ආදායම් රැස් කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**v.**අයකර ගත නොහැකි ආදායම් කපාහැරීම පිළිබඳව අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා වන නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vi.**විනෝද බදු ආඥා පනතේ 2 වගන්තිය යටතේ විනෝද බදු පැනවීමට අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vii.**ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල මුදල් පිළිබඳ කාර්ය හා සම්බන්ධව අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**viii.**ප්‍රාදේශීය සභාව සතු දේපල බදුදීම, කුලියටදීම, බැහැර කිරීම හෝ වෙනත් ආකාරයක ගනුදෙනු පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග කවරේද යන්න නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ix.**ප්‍රාදේශිය සභාවට දේපල අත්පත් කරගැනීම හා මිලදී ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**x.**ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන වෙනත් මුදල් ගනුදෙනු කාර්ය පිළිබඳ තීරණ සඳහා අදාල නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xi.**සෙසු කාරක සභා විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට කෙරෙන නිරීක්ෂණ සලකා බලමින් ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xii.**ප්‍රාග්ධන භාණ්ඩ හා තොග භාණ්ඩ හෝ ද්‍රව්‍ය මිලදී ගැනීම ,ගබඩා කිරීම, නිකුත් කිරීම හා අවම තොග මට්ටම් පවත්වා ගැනීම සිදු කිරිමේදි අනුගමනය කළයුතු ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xiii.**වාර්ෂික භාණ්ඩ හා තොග සමීක්ෂණ කාර්ය සිදු කිරීම පිළිබඳ ප්‍රගතිය මැන බැලීම සහ එහිදී අනුගමනය කළයුතු ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xiv.**එක් එක් වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගනු ලබන අබලි භාණ්ඩ අලුත්වැඩියා කිරීම, විකිණීම හෝ විනාශ කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xv.**ප්‍රාග්ධන භාණ්ඩ හෝ තොග ඌණතා පිළිබඳව විමර්ෂණය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xvi.**ප්‍රාග්ධන භාණ්ඩ වලට හෝ තොග භාණ්ඩ වලට සිදුවන හානි හෝ අඩුපාඩු පිළිබඳව විමර්ශනය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xvii.**ගබඩා කළමණාකරනයේදී අනුගමනය කළයුතු ක්‍රමෝපාය අධ්‍යනය කිරීම හා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xviii.**ප්‍රාදේශීය සභාව සතු වත්කම් වල නාස්තිය හා දූෂණය අවම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xix.**ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇති කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේදි සිදුවිය හැකි වියදම් අවම කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xx.**ප්‍රාදේශීය සභාවේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxi.**ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තනතුරු හා ධුර ඇති කිරීම පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස අධ්‍යනය කර මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**xxii.**ප්‍රාදේශීය සභාවට අවශ්‍ය බවට ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ කෙරෙන තනතුරු හා ධුර පළිබඳව වැටුප් ,දීමනා හෝ පාරිශ්‍රමික නියම කිරීමට හැකිවනු පිණිස අධ්‍යනය කර මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**xxiii.**ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ගමන් වියදම් හෝ පරිවර්තිත ගමන් වියදම් සීමා නියම කිරිම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxiv.**ප්‍රාදේශීය සභා සභිකයන්ගේ සහ නිළධාරීන්ගේ නිවාස දුරකතන සැපයීම සහ සුභසාධනය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxv.**ප්‍රාදේශීය සභාවේ කාර්යයන්ට අදාළව මහ සභාව විසින් පවත්වාගතයුතු දත්ත හා සංඛ්‍යා ලේඛන කවරේද යන්න තීරණය කිරීම.

**xxvi.**දේශීය සභාවේ ලිපි ලේඛන වල ආරක්ෂාව සහ ලේඛනාගාර පිළිබඳව මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**xxvii.**ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයට කාර්ය පැවරිම හා ඒවා සමාලෝචනය පිණිස අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxviii.**ප්‍රාදේශිය සභාවට අදාළ නීති කෘත්‍ය පිළිබඳව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxix.**ප්‍රාදේශීය සභාව විසින් පනවා ගතයුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxx.**ප්‍රාදේශීය සභාව විසින් ඉටුකළ යුතු සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළත් යෝජනා ඇතුළත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxxi.**සභාව විසින් අනුමත කළ සංයුක්ත සැලැස්මට අනුව එක් එක් වර්ෂයේ මූල්‍ය සැලැස්මට අනුව සමගාමීව සංවර්ධන යෝජනා ප්‍රමුඛගත කිරීම, වාර්ෂික සංවර්ධන සැලැස්ම කෙටුම්පත් කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxxii.**සභාව විසින ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වල / කර්මාන්තවල ප්‍රගතිය වරින් වර විමර්ශනය කිරීම , ඒ සහා කළයුතු අත්‍යාවශ්‍ය වෙනස්කම් හෝ සංශෝධන සහ අනුගමනය කළයුතු වෙනත් ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxxiii.**අවශ්‍ය අවස්ථාවක දී වාර්ෂික සංවර්ධන සැලැස්මට කළයුතු වෙනස්කම් හෝ සංශෝධන පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලදී.

නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාව සඳහා ගරු උප සභාපතිතුමා ඇතුළු පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් ධායකයින් සුදුසු බව හා එම කාරක සභාවට පැවරෙන කාර්ය, කර්තව්‍ය හා බලතල ගරු මන්ත්‍රී ඩබ්. එම්.රූපසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

**02. නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාව**

01 . ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා - සභාපති
02. ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය
03. ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.එම්. එම්. අසංක වාසළ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා
06. ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය

හා සම්පත් දායකයින් ලෙස,

01 .ඩබ්.ආර්.නිමල් රණවීර මහතා - විශ්‍රාමික සභා ලේකම්
02. ජේ.ඒ.ප්‍රේමලාල් වන්නිසිංහ මහතා - සමෘද්ධි කළමණාකරු
**03. ඩී.එම්. කුලරත්න මහතා - විශ්‍රාමික ඉංග්‍රීසි ගුරු උපදේශක (ඉවත් කර ඇත.)**
ඩී.එම්. විජේවික්‍රම මහතා - විශ්‍රාමික හමුදා නිළධාරි
04. ජේ.ඩබ්.එම්.ජයසිංහ මහතා - සංචාරක උපදේශක

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

**I.**අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික ,සාමාජීය හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මඟින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ii.**සභා බල ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන සංවිධාන ඇති කිරීම, පවත්වාගෙන යාම, ඒ සංවිධාන ශක්තිමත් කිරීම සහ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යයන්ට ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීමට අනුගමනය කළයුතු ක්‍රමෝපාය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**iii.**සභා බල ප්‍රදේශ තුළ ජීවත්වන ආබාධිත තැනැත්තන් පුනුරුත්ථාපනය කිරීම හා ඒ පිළිබඳ අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**iv.**සභා බල ප්‍රදේශය තුළ පොදු උත්සව ,සංස්කෘතික ක්‍රියාකාරකම් , ආගමික උත්සව හා ප්‍රජා පිළිගැනීම් සංවිධාන කිරීම, දහම් පාසල්වල කාර්ය ප්‍රවර්ධනය සහ පොදු විනෝද කටයුතු සංවිධානය කිරීම පිළිබඳ ව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**v.**සභා බල ප්‍රදේශය තුළ පොදු වෙළඳපොළ සහ සති පොළ පැවැත්වීම පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vi.**සභා බල ප්‍රදේශය තුළ ක්‍රීඩා භූමි සහ ක්‍රීඩාගාර ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vii.**සභා බල ප්‍රදේශය තුළ ප්‍රජාශාලා හා උත්සව ශාලා ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**viii.**ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන මහජන පුස්තකාල පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ix.**මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ ඇතිකිරීම ,ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහාය ලබාදීමට  අදාළ නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**x.**බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන සමඟ සමීපව සම්බන්ධ වෙමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පහසුව සුභසාධනය සඳහා අවශ්‍ය නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xi.**සභා බල ප්‍රදේශය තුළ ඇතිවිය හැකි ගිනි ගැනීම් වැලැක්වීම හා ගිනි නිවාරණය පිළිබඳව ආසන්න පළාත් පාලන ආයතන සමඟ එකඟතා ඇතිකර ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ  මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xii.**සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන දිළිඳු කැනැත්තනට උපකාර කිරීම සහ ජනතාවගේ ආපදා අවස්ථා කළමණාකරනය පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ  මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මන්ත්‍රීතුමා විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ මාධ්‍යවේදීන් කාරක සභා සඳහා පත්කර නොගන්නා  බව ප්‍රකාශ කර සිටියේය.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වගන්තිය හා  184 වගන්තිය සමඟ කියවිය යුතු රීති සංග්‍රහයේ 31 (6) වගන්තියේ පුවත්පත් වාර්තාකරුවන් උපදේශක කාරක සභාවට ඇතුළත් නොකළ යුතු බව දක්වා ඇති බව පෙන්වා දෙන ලදි

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව සඳහා යෝජනා කළ **ඩී.එම්.කුලරත්න මහතා ඉවත් කොට ඒ වෙනුවට ඩී.එම්. විජේවික්‍රම මහතා (විශ්‍රාමික හමුදා නිළධාරි) පත්කර** ගරු මන්ත්‍රී ඩබ්. එම්.රූපසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාර්මික සේවා කාරක සභාව සඳහා පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් දායකයින් සුදුසු බව හා එම කාරක සභාවට පැවරෙන කාර්ය,කර්තව්‍ය හා බලතල ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංලිකා ජයලත් මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.

**03.කාර්මික සේවා පිළිබඳ කාරක සභාව**

01 .ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා - සභාපති
02. ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා
06. ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා

හා සම්පත් දායකයින් ලෙස

01 .වයි.කේ.ඩී.එම්. කෝට්ටේගොඩ මහතා - ව්‍යාපාරික
02. ඩබ්.එම්.ලලිත් රූපසේන මහතා - වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශක
03. එස්.ඒ.බී.පුලස්ති රංගනාත් මහතා - වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශක
04. ජේ.ඒ.විමලසේන මහතා - විදුහල්පති සේරුව ප්‍රාථමික විදුහල

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

I. සභාව ඉඩම් පරිපාලනය පිළිබඳව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

ii. වීථි හා මාර්ග සම්බන්ධව ප්‍රාදේශීය සභාව සතු බලතල,කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළයුතු ක්‍රමවේද පිළිබඳව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

iii. වීථි මාර්ග නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා ප්‍රසිද්ධ අධ්‍යාන ආදිය නම් කිරීම පිළිවෙලින් ප්‍රාදේශීය සභා පනතේ 32(ඇ) වන සහ 198 වන වගන්ති යටතේ මහා සභාව විසින් ගනු ලැබිය යුතු තීරණ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

iv. වීථි අවහිර කිරීම, වීථි ආදියට හානි පැමිණවීම, අයුතු ඇඳා ගැනීම්, වීථිවල කටයුතු වලට බාධා වන ගස් සහ අනතුරුදායක ගස් හෝ අතු හෝ කඳන් හෝ ගෙඩි ඉවත් කිරීම පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

v. බල ප්‍රදේශය තුළ නව වීථි මාර්ග ඇති කිරීම හෝ මාර්ග පුළුල් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

vi. සභා බල ප්‍රදේශය තුළවීථි රේඛා නියම කිරීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

vii. වීථිවල කෙරෙන කරදර ආදිය පාලනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

viii. විශේෂ කාර්ය සඳහා වීථි ප්‍රයෝජනයට ගැනීම සහ සභා බල ප්‍රදේශයේ වීථිවල පවතින බාධක හා ප්‍රසර්පණ ඉවත් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

ix. සභා බල ප්‍රදේශය තුළ පවත්නා අනවසර ඉදිකිරීම් පාලනය , නීත්‍යානුකූල කිරීම හෝ ඉවත් කිරීම සහ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත මඟින් ප්‍රාදේශීය සභාවට පැවරෙන කාර්ය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

x. වීථි හා පොදු ගොඩනැගිලි ආලෝකකරණය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

xi. දේශීය සභා බල ප්‍රදේශය තුළ සියළුම වීථි, මාර්ග, මංමාවත්, පටුමංවල රථවාහන ගමනාගමනය නියාමනය හා පාලනය කිරීම පිළිබඳව මහා සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යනය කර නිර්දේශ වාර්ථා ඉදිරිපත් කිරීම.

xii. ඉඩම් කට්ටි කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සැලසුම් හඳුනා ගෙන උචිත බලධාරියා වෙත නිර්දේශ කිරීමට මහා සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

xiii. සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වල/ කර්මාන්තවල කාර්ය සඳහා ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

xiv. ප්‍රාදේශීය සභාව සතු මාර්ග සහ ඉඩම් පිළිබඳව දත්ත පද්ධතිය කලින් කල සමාලෝචනය කිරීම සහ ඒ පිලිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

xv. සභාව සතු මාර්ග ,ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා අලුත්වැඩියා කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්තී මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලදී.

පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව සඳහා පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් දායකයින් සුදුසු බව හා පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

**04. පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව**

01 .ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංගලිකා මැතිතුමිය - සභාපති
02. ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා
03. ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතමා
04. ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය
05. ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි මැතිතුමා
06. ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්පකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා

හා සම්පත් දායකයින් ලෙස
01 . බී.එම්.ප්‍රේමවර්ධන මහතා - විශ්‍රාමික විදුහල්පති
02. කේ.එම් නන්දසේන මැතිතුමා - පාසල් ගුරු
03. සී.ඩබ්.ඒ. ඩිංගිරි බණ්ඩා මහතා - විශ්‍රාමික විදුහල්පති
04. ඩබ්.එම්. වූලරත්න මහතා - සමාජ ක්‍රියාකාරී

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

**I.** මාතෘ හා ළමා සෞඛ්‍ය නැංවීම ,බටහිර වෛද්‍ය සායන සහ ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**ii.** මදුරුවන් හෝ වෙනත් කෘමි සතුන් බෝවීම, ඒ මඟින් රෝග බෝවීම පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**iii.** මහජන පීඩා වැලැක්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**iv.** නිවාසවල ඇති කරන සහ දඩාවතේ යන සුනඛයන් එන්නත් කිරීම , සුනඛ ගහනය පාලනය කිරීම හා ජලභීතිකා රෝගය පාලනය කිරීම වැලැක්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**v.** ආසාදන රෝග හා වසංගත රෝග මර්ධනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**vi.** වැසිකිළි සහ වසුරු වලවල් විධිමත් කිරීම , පාලනය හා ගලි බවුසර් සේවා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**vii.** ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ අතුරු ව්‍යවස්ථාවලින් සභාවට බලය ලැබී ඇති කාර්ය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**viii.** සුසානභූමි හා ආදාහනාගාර විධිමත් කිරීම හා පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**ix.** සභා බල ප්‍රදේශය තුළ රැස් කරනු ලබන කසළ රැස් කිරීම , ප්‍රවාහනය, පිරියම් කිරීම,අවසන් බැහැර කිරීම සහ කාණු පිරිසිදු කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**x.** අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය මිලට ගැනීම 7R System ) සහ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.WP LO 2926 ලොරි ජලබවුසරය කතරගම පෙරහැර පැවැත්වෙන සමයේදී එහි සේවාව සඳහා ලබාදීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු WP LO 2926 ලොරි ජල බවුසරය කතරගම පෙරහැර පැවැත්වෙන සමයේදි එහි සේවයේ යෙදවීම සඳහා ලබා දෙන ලෙස 2025.06.16 දින දුරකතනයෙන් (ලිඛිතව ඉල්ලීම් කරන තෙක්) ඉල්ලීම් කරන ලදි. එම ඉල්ලීම අනුව WP LO 2926 ලොරි බවුසරය ඉන්ධන රහිතව ඒ සඳහා ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී බිබිල ප්‍රදේශයට ඉදිරි මාස දෙක ඇතුළත ජල හිඟයක් ඇති වන නියං කාලය බැවින් WP LO 2926 ලොරි ජල බවුසරය ලබාදීමේදී ප්‍රදේශයේ ජනතාවට ජල හිඟයක් ඇතිවේදැයි අවදානම පිළිබඳ සලකා බලා කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා පවසා සිටියේ ය.

මේ වන විට ජල හිඟයක් මෙම ප්‍රදේශයේ නොමැති බැවින් ඉන්ධන රහිතව කතරගම පෙරහැර පැවැත්වෙන සමයේදි එහි සේවයේ යෙදවීම සඳහා WP LO 2926 ලොරි බවුසරය ලබාදීමට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09. බිබිල පොදු සුසාන භූමිය හා මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල පොදු සුසාන භූමිය විධිමත් ලෙස සකස් කිරීම හා ආරක්ෂිත ස්ථානයක් බවට පත් කිරීම හා රතුපස්කැටිය වසමේ බලවේග පෙහෙකම්හල අසල සිට බිබිල පොලීසිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම (මීටර් 500) හා ගොඩමඩේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම (කි.මීටර් 01) සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ  යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ  මැතිතුමා අදහස් දක්වමින්  බිබිල පොදු සුසාන භූමිය තුළ විවිධ අපචාර , විනය විරෝදී ක්‍රියා සිදුවන ස්ථානයක් බැවින් එම සුසාන භූමිය වටා දැල් වැටක් ගසා ඉදිරිපස ගේට්ටුවක් සකස් කිරීමට සුදුසු බවත් බලවේග පෙහෙකම්හල අසල සිට බිබිල පොලීසිය දක්වා මාර්ගය මධ්‍යයෙන් රෝහලෙන් පිට කරන අප ජලය ගලා යන බැවින් කාණු පද්ධතිය සකස් කිරීමට සුදුසු බවද පවසා සිටියේය.

රෝහලේ අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා ව්‍යාපෘතියක් අනුමත වී ඇති බැවින් එම ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනු ඇතැයි ගරු සභාපතිතුමා දන්වා සිටියේය.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල පොදු සුසාන භූමිය විධිමත් ලෙස සකස් කිරීම හා ආරක්ෂිත ස්ථානයක් බවට පත් කිරීම හා  රතුපස්කැටිය වසමේ බලවේග පෙහෙකම්හල අසල සිට බිබිල පොලීසිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම (මීටර් 500)  හා ගොඩමඩේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම (කි.මීටර් 01) සුදුසු බව තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.10. පොළ භූමියෙහි භුක්ති විඳින ඉඩම් කොටස පවරා ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල සතිපොළ භූමිය පවරා ගැනීම සඳහා බිබිල ප්‍රාදේශීය සභාව විසින් රජයේ මිනින්දෝරු වෙත මැනුම් ගාස්තු ගෙවා , වසමේ ග්‍රාම නිළධාරි සහ රජයේ මිනින්දෝරු විසින් මැනුම් කටයුතු සිදු කිරීමේදී අදාළ ඉඩමෙහි ස්ථිර අනවසර ඉදිකිරීම් රාශියක් ඉදිකර තිබූ නිසා මැනුම් කටයුතු  කිරීමට නොහැකි වුණි. එබැවින් එම සතිපොළ භූමිය ඉඩමෙහි ඇති ස්ථිර අනවසර ඉදිකිරීම් ඉවත් කර එම ඉඩම මැන බිබිල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සතිපොළ ගොඩනැගිල්ල අසල ඉදිකර ඇති ඇක්ටඩ් ගොඩනැගිල්ලෙන් කිසිම ප්‍රයෝජනයක් මහජනතාව නොගන්නවා මෙන්ම එයින් සභාවටද කිසිදු ආදායමක් නොලැබෙන බැවින් මෙය ඉවත් කොට නව කඩ කාමර කිහිපයක් ඉදිකිරීමට සුදුසු බවත් මෙහි මැනීම් කටයුතු සිදු කර සතිපොළ භූමියට අයත් ඉඩම් කොටස වෙන් කර ගැනිම සඳහා මැදිහත් වන  බවත් ගරු මන්ත්‍රී පී.කේ.ඩී.පුෂ්පකුමාර මැතිතුමා  ප්‍රකාශ කරන ලදි.

බිබිල සතිපොළ භූමියට අදාළ ඉඩමෙහි ඉදිකර ඇති ස්ථිර අනවසර ඉදිකිරීම් ඉවත් කොට මැනුම් කටයුතු සිදුකර අදාල සතිපොළ භූමිය ඉඩම මැන වෙන් කර බිබිල ප්‍රාදේශීය සභාව සඳහා පවරා ගැනීමට සුදුදු බව තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11.බිබිල සම්පත් මධ්‍යස්ථානය (තොරතුරු හා තාක්ෂණික) වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයට කුලියට දීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සම්පත් මධ්‍යස්ථානය තොරතුරු හා තාක්ෂණික පාඨමාලා පවත්වාගෙන යාම සඳහා 2024.08.08 දින සිට 2033.09.30 දින දක්වා කාලයක් ඉල්ලුම් කර ඇත. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික කුලී මුදල රු.82000.00ක ලෙස තක්සේරු කර ඇත. මෙම මුදලට උක්ත කාලසීමාව සඳහා වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයට කුලියට දිම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇතත් මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. මෙම ගොඩනැගිල්ල කුලියට දීම, සභාවට ආදායම් උත්පාදන මාර්ගයක් බැවින් මේ සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලැබෙන තෙක් මාසික කුලිය රු.82000.00ක මුදලකට වසර 03ක් සඳහා කුලියට ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

ඉන් අනතුරුව යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී බිබිල ප්‍රාදේශීය සභාවට අයත් මෙම (තොරතුරු තාක්ෂණික) සම්පත් මධ්‍යස්ථානය සම්පූර්ණයෙන්ම ආයුර්වේදය සඳහා යොදා ගැනීම සුදුසු බවත් එසේ නැතිනම් එම ගොඩනැගිල්ලේ ඉහළ හෝ පහළ යන මහල් දෙකෙන් එක් මහලක් වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයටත් අනෙක් මහල ආයුර්වේදයටත් ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා හා ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් පවසා සිටින ලදී.

මෙම මහල් දෙකෙන් එක් මහලක් ආයුර්වේදය සඳහා ලබාදීමට වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය කැමති නොවනු ඇතැයිද එසේ වුවහොත් සභාවට ලැබීමට ඇති ආදායමක් අහිමි වීමට ඉඩ ඇතැයි පවසා සිටි ගරු සභාපතිතුමා මෙම සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි පහත මහළ ආයුර්වේදයට ලබාදීමට වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයෙන් එකඟතාවය විමසා ඒ සඳහා එම ආයතනය එකඟ නොවන්නේ නම් මෙම ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයටම බඳුදීමට සිදුවන බව පවසා සිටියේය.

වර්ල්ඩ් විෂන් ආයතනය විසින් මෙම ගොඩනැගිල්ලෙහි දැනට පවත්වනු ලබන පරිඝණක පාඨමාලා හදාරනු ලබන දරුවන්ගෙන් කිසිඳු මුදලක් අයකරනු නොලබන අතර එහි උඩුමහල කුලියට දීම මගින් උත්පාදනය කරගනු ලබන ආදායමෙන් බිබිල ප්‍රාදේශීය සභාවට කුලී ගෙවීමට එම ආයතනය තීරණය කර ඇති බව එහි කළමණාකාරතුමා තමා සමඟ පැවසූ බවත් උඩු මහලෙහි අනෙක් කොටස භෝජනාගාරය ලෙස භාවිතා කරන බැවිනුත් එම ආයතනයෙහි එක් මහලක් ආයුර්වේදය සඳහා ලබා නොදෙනු ඇතැයි ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් පවසා සිටින ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව පිළිබඳ සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

දිගින් දිගටම මෙම ආයතනයටම බදු ලබාදීම නිසා අනිසි ප්‍රතිඵල ලැබීමට ඉඩ ඇති බැවින් මෙම ගොඩනැගිල්ල අවුරුදු 03කට වරක් තක්සේරු කර මාසික බදු වාරික වැඩි කර ගැනීමට සුදුසු බව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් පවසන ලදී.

මෙම සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයට නව බදු ගිවිසුමකට එළඹ වසර 03 ක කාලයක් සඳහා මාසිකව රු.82000.00 ක කුලියකට බදු දීමටත් මෙම ගොඩනැගිල්ල වසර 03කට වරක් තක්සේරු කර මාසික බදු කුලිය වැඩි කර නැවත බදු දීමට තීරණය කරන ලදී.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.12. උණගොල්ල හෙලඅරාව අනාරක්ෂිත මාර්ග කොටස ජල කාණුවද සමඟ පුළුල් කර සකස් කිරීම.</u>

හෙවෙල්වෙල ග්‍රාම නිළධාරි වසමෙහි උණගොල්ල හෙලඅරාව මාර්ගයේ උණගොල්ල හන්දියේ සිට ඉහළට මීටර් 150ක පමණ දුර ප්‍රමාණයක් අනතුරුදායක වංගුවක්ද සහිතව අධික බෑවුම් සහිත මාර්ග කොටසක් ඇත. මෙම කොටසෙන් වාහන දෙකකට මාරුවීම ඉතා අපහසු අතර මෙම වංගු කොටසේදී රිය අනතුරු බහුලව සිදුවේ. මෙම හේතුව නිසා මීටර් 150ක් පමණ වන මෙම මාර්ග කොටස ජල කාණුවද සමඟ පුළුල් කර ඉදිකිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.13.කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇදිරිනීතිය පැනවූ දිනවල සහ රටේ පැවති තත්වය මත හිඟ බදු කුලී මුදල් ලේඛණ වලින් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සම්බන්ධවයි</u>.

2021 වර්ෂයේදී කොවිඩ් වසංගතය පැතිරී ගිය හෙයින් බදුකරුවන් හට කඩ වසා තැබීමට සිදුවූ හෙයින් ආදායම් උත්පාදනය කිරීමට නොහැකි විය. එබැවින් මාසික බදුකුලිය ගෙවීමට නොහැකි වූ බව බදුකරුවන් විසින් දන්වා ඇති හෙයින් රටේ පැවති තත්වය පිළිබඳ සලකා බලා සභා තීරණ ගෙන සහන ලබාදී ඇත.

ඒ අනුව සහන ලබා දුන් කාල සීමාවන්ට අදාළව සභාවට අයවීමට තිබූ බදු කුලී මුදල් ලේඛන වලින් ඉවත්කර ගැනීම සඳහා ඊට අදාල සභා තීරණ සහ බදුකරුවන්ගේ ඉල්ලීම් ලිපි සහිතව අදාල ලිපිලේඛණ සකස් කර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට අයවිය

යුතු මුදල් අත්හැරීම සඳහා කිහිප වතාවක්ම ලිපි ලේඛණ ඉදිරිපත් කළ නමුත් සහකාර පළාත් පාලන කොමසාරිස් තුමා විසින් එම ලිපිගොනු නැවත හරවා එවා ඇත.

ඒ අනුව සහකාර පළාත් පාලන කොමසාරිස් තුමාගේ 2023.02.06 දිනැති ලිපිය මගින් දන්වා එවන ලද්දේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව කපාහැරීම සනාථ කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත්කර තිබිය යුතුය යනුවෙනි.ඒ අනුව කොවිඩ් වසංගත තත්වය අනපේක්ෂිත ලෙස පැමිණි තත්වයක් වන බැවින් මෙවැනි තත්වයක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ පනතේ වගන්ති ප්‍රකාරව මෙම හිඟ බදු මුදල් ලේඛන වලින් ඉවත් කිරීම සඳහා ලිපි ගොනු සකස් කිරීමට හැකියාවක් නොවූ බැවින් ඒ සඳහා සාධාරණී කරණ වාර්තාවක් සකස් කර ඒ සමඟ අදාළ ලිපි ලේඛන නැවත යොමු කිරීමට අප විසින් කටයුතු කළද ඒවාද නැවත හරවා එවා තිබුණේ 2024.04.26 දින පවත්වන ලද විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව නිවැරදිව කොරෝනා වසංගතය හේතුවෙන් ඇදිරි නීති පනවන ලද කාලයේ දින ගණනය කර සකස් කර එම ලිපි නැවත ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීමට සලස්වන ලෙස දන්වමිණි.ඒ අනුව අප විසින් බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි /බිබිල පොලිස් ස්ථානාධිපති /බිබිල ප්‍රාදේශීය ලේකම් වෙතින් මෙම කාලසීමාවට අදාලව ඇදිරි නීතිය පැනවූ දින පිළිබඳව තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටි නමුත් ඔවුන් සතුව එම තොරතුරු නොමැති බව දන්වා එම තොරතුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලෙසයි.

ඒ සම්බන්ධයෙන් අප විසින් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලා සිටි අතර එම තොරතුරු අප වෙත ලැබුණි. ලද තොරතුරු අධ්‍යනය කිරීමේදී එමගින් අපගේ සභාවට අයත් වෙළඳසැල් වසා තැබුවා යැයි සටහන් කර ඇති මාසවලට අදාළව තොරතුරු ලබාගත නොහැකි විය.එසේම මෙම කාලසීමාව තුල රජය විසින් ඇදිරි නීතිය නොපැන වුවද පාරිභෝගිකයන් නගරයට නොපැමිණීම හේතුවෙන් වෙළඳ ස්ථාන වසා තැබීමට ව්‍යාපාරිකයන්ට සිදුවිය. එසේම බදු කුලී ගෙවීමට තරම් ආදායමක් මෙම කාලසීමාව තුල නොලැබුණු බව අපගේ බදු කරුවන් ඔවුන්ගේ ලිපි මඟින් දැනුම් දී ඇත.

ඉහත කරුණු පිළිබඳ සලකා බැලීමේදී විගණන කළමනාකරණ කමිටුව පවසන පරිදි අප හට ලැබී ඇති තොරතුරු අනුව දින ගණනය කිරීමේ හැකියාවක් නොමැත. එසේම මෙම කාලසීමාවන්ට අදාලව එවකට පැවති සභාව මගින් සභා තීරණ ගෙන සහන ලබා දී තිබූ බැවින් ඒ සම්බන්ධයෙන් බදු කරුවන්ද දැනුවත්වී සිටින බැවින් ඔවුන්ගෙන් එම කාලසීමාවන්ට අදාලව එම කුලී මුදල් අය අය කර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමද ගැටළු සහගතය.ඒ අනුව මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොරෝනා සමය තුළ ඇදිරි නීතිය ක්‍රියාත්මක වූ බැවින් කඩකාමර වසා තිබූ බව සියළු දෙනාට නොරහසක් නොවූවද නගරයේ කඩ හිමියන් ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන හා සනාථ කළ හැකි ලියවිලි සපයා ගෙන මෙම යෝජනාව නැවත ඉදිරිපත් කිරීම සඳහා කල් තැබීමට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.02. ගරු මන්ත්‍රී ඩබ්.එම්. මනෝජ් අසංක වාසළ මැතිතුමා.

### 05.02.01. ඉදිවෙමින් පවතින පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ නිම කිරීම සම්බන්ධවයි .

බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාසයට අයත් මල්ලැහැව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණිය සඳහා පොදු ස්ථානයක කාර්යාලයක් නොමැතිවීම නිසා නිළධාරිණිය මෙන්ම සේවාලාභීන්ද ගැටළු රැසකට මුහුණ දෙනු ලබයි. දැනට පෞද්ගලික නිවසක කාර්යාලය පවත්වා ගෙන යනු ලබයි.
මෙම ප්‍රදේශයේ **දිරිය ශක්ති මව් හවුල** බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතුමාගේ අනුමැතිය ඇතිව වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයේ ආධාර (ගල්,කම්බි,සිමෙන්ති,සීට්) ලබාගෙන ප්‍රජා දායකත්වයෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කර ඇත.එහි ඉතිරි වැඩ නිම කිරීමට මව් හවුලට අසීරු බැවින් එම ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ නිම කරදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

### 05.02.02. බදුල්ලගම්මන කොටබෝගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බදුල්ලගම්මන කොටබෝගොඩ මාර්ගය අබලන්ව පවතින අතර වැසි කාලයේදී පයින් ගමන් කිරීමට මෙන්ම ප්‍රවාහන කටයුතු සිදු කිරීමට අපහසු වී ඇත. එබැවින් මෙම මාර්ගය කුට්ටිගල් අල්ලා හෝ කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.03. ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියාණි මංගලිකා මැතිතුමිය.

### 05.03.01. බිබිල වැගම කොට්ඨාසයේ කඩිනම් අත්‍යාවශ්‍ය මාර්ග සංවර්ධන සහ වෙනත් යෝජනා.

බිබිල වැගම කොට්ඨාසයට අයත් ,
**වැගම උතුර -**
01.පතිගවත්ත පාරෙහි ඒ දණ්ඩක් දමා ඇති බෝක්කුව සැකසීම.

02.පතිගවත්ත පාර සකසා කාණු දැමීම.

03.වැගම ගම් උදාව අවසාන පටුමග ප්‍රධාන පාරේ සිට දෙහිගහලන්ද මාර්ගය මට්ටම් කර කාණු දමා පිළිසකර කිරීම.

**වැගම දකුණ -**

01. තුඹලේරුව කහඹිලියාලන්ද වටවන කැළැවැදී ඇති පාර (1 Km)සැකසීම.
02. 2කණුව කුඩුම්රහවත්ත බදුල්ලගම්මන මාර්ගය (7Km) බදුල්ලගම්මන මාර්ගය සකසා ගැනීම.
03. 3 කණුව පළකුඹුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

**කරගහවෙල බටහිර -**

01. කරගහවෙල සිට දෙහිගලවත්ත දක්වා යාමට නොහැකි 4Kmක් පමණ වන මාර්ගය සැකසීම.
02. 5කණුව සමාධි නිකේතනය අසලින් ආරම්භ වන 4Kmක් පමණ ගම ඇතුළට ගොස් කරගහවෙල ප්‍රධාන මාර්ගයෙන් අවසන් වන අතුරු මාර්ගය සකසා ගැනීම.
03. කරගහවෙල පොදු සුසාන භූමිය පිළිසකර කර ගැනීම.

**කරගහවෙල නැගෙනහිර -**

01. හැමගස්මුල්ලපාර, හැමගස්මුල්ල පහළ පාර කාණු දමා පිළිසකර කිරීම.
02. ඉහත පාර හරහා වැටී ඇති දිය පාරට බෝක්කුවක් දැමීම.

**කෙහෙල් අත්තාවෙල -**

01. පෙරිය පැලැස්ස ප්‍රජා ශාලාව අසළ තිබෙන ක්‍රිඩා පිටිය ,සුසාන භූමිය සකසා ගැනීම.
02. කිරිමැටිය වෙළ මැද මාර්ගය (1Kmක් පමණ වන ) වන යන්ත්‍ර යොදා මට්ටම් කිරීම හා පසුව කොන්ක්‍රිට් කිරීම.
03. 6 කණුව අලහවත්ත මාර්ගය (800 m) සංවර්ධනය කිරීම.

යන සංවර්ධන යෝජනා වැගම වසම තුළ ක්‍රියාත්මක කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.04. ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා.

### 05.04.01. නාගල මොරත්තමුල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් නාගල මොරත්තමුල්ල මාර්ගයෙහි ලංගම හා පෞද්ගලික බස් 02ක් ගමන් කරනු ලබයි. නමුත් මෙම මාර්ගය කැඩී බිදී අබලන් වී ඇත. එබැවින් කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.05. ගරු බී.එම්.වීරසේකර මැතිතුමා.

## 05.05.01.නිල්ගල කොට්ඨසයට අයත් මාර්ග ,බෝක්කු හා වීජී පහන් සම්බන්ධවයි.

**බුළුපිටිය වසම**

| මාර්ගය | බෝක්කු ගණන | වීජී පහන් |
|---|---|---|
| හමනව මාර්ගය | 05 | 02 |
| හමනව සමගිපුර මාර්ගය | 03 | - |
| හමනව අලකොළමඩ මාර්ගය | 02 | - |
| ගඟසිරිපුර මාර්ගය | 03 | 03 |
| මැදලන්ද මාර්ගය | 02 | 04 |
| පහලවත්ත මාර්ගය | 01 | 03 |
| ජේරන මාර්ගය | 02 | 06 |

**නිල්ගල වසම**

| ගම | ස්ථානය | බෝකකු ගණන | වීජී පහන් |
|---|---|---|---|
| වැද්දාබැදිහීන්න | මහපුදාම මාර්ගය | 01 | 01 |
| 7 කණුව | මල්පොල උඩයාකුඹුර මාර්ගය | 02 | 01 |
| මල්දම්අඹේ | - | - | 01 |
| සේරව | ප්‍රධාන මාර්ගය,කොට්ටගහ වැව මාර්ගය | 02 | 01 |

**ඌරාවුල වසම**

| මාර්ගය | බෝක්කු ගණන | වීජී පහන් |
|---|---|---|
| වැව මාර්ගය | 01 | - |
| බල්ලාගල මාර්ගය | 01 | - |
| කොළොන්අතු මුල්ල මාර්ගය | 02 | - |
| දඹගහපිටිය මාර්ගය | 01 | - |
| දේමෝදර මාර්ගය | 01 | - |
| සොහොන්පිටිය මාර්ගය | 03 | - |
| පුහුල් බෝයාය මාර්ගය | 03 | - |
| වැල්ලේබැද්ද මාර්ගය | 01 | - |
| ඌරාවුල පන්සල ඉදිරිපිට මාර්ගය | - | 01 |

**කරාඩුගල වසම**

| මාර්ගය | බෝක්කු ගණන | වීජී පහන් |
|---|---|---|
| හැකොළොන්දෙනිය ජේරලන්ද මාර්ගය | 04 | 05 |
| පිටවල මාර්ගය | 03 | 03 |
| පැරණි කරාඩුගල මාර්ගය | 03 | 03 |
| අලංවල මාර්ගය | 02 | - |
| කටුවෙවත්ත මාර්ගය | 03 | 01 |
| අතරගල්ල අතුරු මාර්ගය | 01 | - |
| ඌරාවුල මාර්ගය | - | 03 |

ඉහත බුළුපිටිය, නිල්ගල, ඌරාවුල, කරාඩුගල යන වසම් වලට අයත් මාර්ග , බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමට හා වීජී පහන් සවි කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.05.02. කරාඩුගල ගම්මානයට පිවිසෙන මාර්ගයෙහි ගරා වැටී ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.</u>

කරාඩුගල ගම්මානයට පිවිසෙන මාර්ගයේ දීර්ඝ කාලයක් තිස්සේ අනාරක්ෂිත ලෙස බෝක්කු කටවල් දෙකක් ගරා වැටී ඇති අතර මේ වනවිට වාහනයකට පවා යාමට නොහැකි තරම් දැඩි ලෙස අබලන් වී ඇත. පාසල් ළමුන්,දෛනිකව කටයුතු වල යෙදෙන ජනතාව මෙනිසා දැඩි අසීරුතාවයකට පත්ව ඇති අතර මෙය භාවිත කරනු ලබන්නේ කිසිදු විකල්ප මාර්ගයක් නොමැති නිසාවෙනි. මේ නිසා අනතුරුවලටද ප්‍රදේශවාසීන් මුහුණ දී ඇත. එබැවින් හදිසි ආපදා යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.05.03. කරාඩුගල ගම්මානයේ පානීය ජලය ලබා ගන්නා ළිං දෙකක් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.</u>

කරාඩුගල ගම්මානයේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලූ පොදු ළිං දෙක ගරා වැටී ඇති නිසා ගම්වාසීන් මහත් අසීරුතාවයකට පත්ව ඇත. දැනට පානීය ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබන්නේ ඉතා දුෂ්කර දුර මග ගෙවා ගොසිනි. එබැවින් මෙම පොදු ළිං දෙක හදිසි ආපදා තත්ව යටතේ ප්‍රතිසංස්කරණය කරදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.06. ගරු ඩබ්.එම්. රූපසේන මැතිතුමා.

## 05.06.01.රදලියද්ද කොට්ඨාසයෙහි සංවර්ධන යෝජනා සම්බන්ධවයි.

01. ඉලුකාපතන ගම්මානයේ සිට පිංකණ්ඩිපොල ගම්මානය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම.
02. කිවුලපිටලන්ද තරුමල්විල මාර්ගයේ ධනපාල මහතාගේ නිවස අසල සිට මීටර් 40ක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.
03. කිවුලපිටලන්ද තරුමල්විල මාර්ගයේ තිලකරත්න මහතාගේ නිවස අසල සිට අතුරු මාර්ගය මීටර් 50ක් ඉදිරියට කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.
04. අඹගොල්ල මඩුලන්ද මාර්ගයේ අබේසූරිය මහතාගේ නිවස අසල සිට ඉදිරියට කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිම.
05. උස්සාගල මල්වත්ත මාර්ගයේ අඩි 4x6 හියුම් පයිප්ප දෙකක් යොදා බෝක්කුව නිමවා සංවර්ධනය කිරීම.
06. රදලියද්ද මඩකලපුව මාර්ගයේ දකුණ වැලි අරාව මාර්ගයේ වසන්ත මහතාගේ නිවස අසල සිට ඉදිරියට කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.
07. එම මාර්ගයේ දකුණට කරුණාරත්න මහතාගේ නිවස අසල සිට බැවුම් මාර්ගය මීටර් 40ක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.
08. අඹගොල්ල දඹේ කිවුල මාර්ගයේ සාගර මහතාගේ නිවස අසල සිට දිවෙන අතුරු මාර්ගය 4x6 හියුම් පයිප්ප දෙකක් යොදා බෝක්කුව නිමවා මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.
09. රදලියද්ද මහින්ද මාවතේ පළමු කිලෝමීටරයේ දකුණට දිවෙන අතුරු මාර්ගයේ කරුමල්විල කඳුරට අඩි 4x6 හියුම් පයිප්ප දෙකක් යොදා බෝක්කුව නිමවා මාර්ගය සංවර්ධනය කිරීම.
10. කනවේගල්ල මාර්ගය සංවර්ධනය කිරීම.
11. රදලියද්ද කොට්ඨාසය තුළ ඇති සභාව සතු පොදු නළ ළිං හා උල්පත් ළිං අලුත්වැඩියා කර ජනතාවට පරිභෝජනය සඳහා ඉඩ සලසා දීම.
12. ප්‍රදේශය පුරා අක්‍රීයව පවතින වීථි පහන් සක්‍රීය තත්වයට පත් කිරීම.
13. කොට්ඨාසය තුළ ඇති මාර්ග සියල්ල සහ සුසානභූමි සභාවේ කම්කරුවන් යොදා මාස තුනකට වතාවක් හෝ තණ කොළ කබා එළි පෙහෙළි කිරීම.
14. අඹගොල්ල සිංහපුර මාර්ගයේ සිට සුසානභූමිය දක්වා දිවෙන මාර්ගයේ අඩක් නිමවා ඇති බෝක්කුව නිමවා ජනතාවට පහසුව සලසාදීම.
15. ප්‍රදේශය තුළ ඇති මාර්ග ජනතාව විසින් අත්පත් කරගෙන ඇති අතර අපද්‍රව්‍ය යොදා අවහිර කිරීම වලක්වාලීම සඳහා ඇති නීතිමය තත්වයන් දැන්වීම් හා අත්පත්‍රිකා මගින් දැනුවත් කිරීම.

රදලියද්ද වසම තුළ ඇති ඉහත සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යොජ්නා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.07. ගරු ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා.

## 05.07.01.පිටකුඹුර කොට්ඨාසයේ සංවර්ධන යෝජනා සම්බන්ධවයි.

01. හද්දඹුවාව දෙල්ගොල්ල මාර්ගයේ දැඩි ලෙස ගිලා බැස ඇති ස්ථානයට පැති බැම්මක් ඉදිකිරීම.
02. හද්දඹුවාව ප්‍රජා ශාලාව නවීකරණය කරදීම.

03. ගංගොඩකැටිය මිණිමුතු පෙර පාසල නවීකරණය කරදීම.
04. දියකොලේයාය ගැටහවෙල පොදු සුසාන ශුමිය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
05. දියකොලේයාය ප්‍රජා ශාලාව සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.
06. තොටිල්ලකැටිය සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.
07. තොටිල්ලකැටිය විජය පෙර පාසලේ සෙල්ලම් මිදුල සඳහා උපකරණ ලබාදීම සහ නවීකරණය කිරීම.
08. දික්ගෙම්මන හාමාපොල පෙර පාසල සඳහා ආරක්ෂිත වැටක් ඉදිකිරීම.
09. බඳුල්ලගස්ගෙදර පොදු සුසානභූමිය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
10. හාමාපොල ගෝමිරිදෙනවෙල පොදු සුසානභූමිය මැනුම් කටයුතු කර වෙන් කරදීම සහ එහි දැනට ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ කටයුතු නිම කරදීම.

ඉහත මාර්ග , බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම හා අනෙකුත් සංවර්ධනය කිරීම් පිටකුඹුර වසම තුළ සිදු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.08. ගරු පී.ජයන්ති මැතිතුමිය.

## 05.08.01. කුරුවාඹ කොට්ඨාසයේ සංවර්ධන යෝජනා සම්බන්ධවයි.

01. අඹේලන්ද වසමට අයත් දසසිත්මාතා ආරාමය ඉදිරිපිට තිබෙන බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම.
02. පල්ලෙ අරාව ග්‍රාමයේ ජලය නොමැතිව අක්‍රීය වී ඇති නළ ළිඳ අලුත්වැඩියා කිරීම.
03. කුරුවාඹ රතුපස්කැටිය ඊරියගොල්ල ඇළ මාර්ගය අබලන් වී ඇති බැවින් කුඹුරුයාය වගාකල නොහැකි තත්වයකට පත්ව ඇති බැවින් එය අවශ්‍ය ලෙස සකස් කරදීම.
04. කොලොන්ගස් ලන්ද මාර්ගයේ ගල්ඔය පාර මීටර් 150ක් පමණ කෝන්ක්‍රීට් කිරීම.
05. පහලඅරාව මාර්ගයේ තිබෙන අතුරු මාර්ග තුනක බෝක්කු සෑදීම.
06. හෙලඅරාව වරල ගම්මානයේ පානීය ජල යෝජනා ක්‍රමයේ වතුර මෝටර් ක්‍රියා කරවීමට පෞද්ගලික නිවසකින් විදුලිය ලබාගෙන ඇත. එහි ගැටලුවක් ඇතිවී ඇති බැවින් විදුලි මීටරයක් සවි කර දීමට කටයුතු කිරීම.

යන සංවර්ධනය කිරීම් කුරුවාඹ කොට්ඨාසය තුළ සිදු කිරීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.09. ගරු ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා.**

**05.09.01.කොටගම කොට්ඨාසයේ කළුටැව හා තබලකැටිය මාර්ගයේ මීටර් කිහිපයක් කොන්ක්‍රීට් කිරිම සම්බන්දවයි.**

කොටගම කොට්ඨාසයට අයත් මූදියල වසමෙහි කළුටැව මාර්ගයේ මීටර් 200ක් හා කොටගම තබලකැටිය මාර්ගයේ මීටර් 100ක කොටසක් කොන්ක්‍රීට් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.**

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.**

2025 මැයි මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

ආදායම්

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 12,851,569.12 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 5,864,186.13 |
| මුළු ලැබීම් | - රු 18,715,755.25 |

වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 9,342,664.68 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 6,022,931.51 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 10,546,072.16 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු 25,911,668.35 |

**2025.05.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 19,406,312.20 |
| අක්කර බදු | - රු. 6,419.14 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 2,082,387.88 |

| | | |
|---|---|---|
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. | 621,756.00 |
| කුලී මුදල් | - රු. | 1,912,421.42 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. | 3,186,518.58 |
| එකතුව | - රු | 27,215,815.22 |

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2025 මැයි මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ පිළිබඳව හා රජයේ නිළධාරීන් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 80% වැටුප් ප්‍රතිපූරණය කරනු ලබන අතර ඉතිරි 20% පළාත් පාලන ආයතනය මගින් ගෙවීම් කරනු ලබන බවත් 2027 වර්ෂය වන විට 100%ක්ම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන ආයතනය මගින් ආදායම් උත්පාදනය කරන ලෙසත් දන්වා ඇති බවත් සභා ලේකම්තුමිය විසින් දන්වා සිටි අතර එම නිසා ආදායම් උත්පාදනය කිරීමේ මාර්ග සකස් කර ගැනීමට පළාත් පාලන ආයතන දැනුවත් කර ඇති බවද පවසා සිටියාය.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් බංකු සැසඳුමෙහි රු.5254097 .71ක දෙවරක් ලදුපත් නිකුත් කර ඇති හරස් සටහන් පිළිබඳ ප්‍රශ්න කළ බැවින් ප්‍රමාද දෝෂයකින් විෂය නිළධාරියා එකම ගණුදෙණුව සඳහා ලදුපත් දෙකක් නිකුත් කර ඇති බැවින් බැංකු ශේෂයට වඩා මුදල් පොතේ ශේෂය වැඩිපුර දැක්වීම බැංකු සැසඳුමේ නිවැරදි කර ඇති බව සභා ලේකම්තුමිය විසින් පැහැදිලි කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී ඒ.එම්. නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.

ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## <u>08.වෙනත් කරුණු</u>

ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසී ය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය අදහස් දැක්වීම.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා තමන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට හා සභාව ආරම්භ වනතුරු රැඳී සිටීමට බිබිල ප්‍රාදේශීය සභාවේ ස්ථානයක් වෙන් කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

සභා කාර්යාලය හා සභාවට යාබද කාමරය පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සඳහා විවෘතව ඇති බැවින් එහි සියළුම මන්ත්‍රීවරුන්ට රැඳී සිටීමට අවසර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටි අතර පනතේ සඳහන් නොවූවද සොයා බලා සුදුසු ස්ථානයක් ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටින ලදී.

2025 ජුනි මස මහ සභාව සඳහා සහභාගී වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2025 ජුලි මස 22 දින පෙ.ව.9.30 ට පමණ සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව ජුනි මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති ,
බිබිල ප්‍රාදේශීය සභාව

පිටපත් -
01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි